# පුංචි මාළු යාළු



බිනුවරී සෙසාක්‍යා බණ්ඩාර

# පුංචි යාළු මාළු

බිනුවරී සෙසාක්යා බණ්ඩාර

කතාව හා චිත්‍ර - බිනුවරී සෙසාක්යා

ISBN - 978-624-206-5

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දශර්නයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාටර් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් “ දිවිය දිනන විද්‍යුත් පොතක් ” ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

**2023** සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ “ දිවිය දිනන විද්‍යුත් පොතක් ” ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලෙඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාථර්නා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමණාකරණ මණ්ඩලය ගුරු භවතුන් දෙමාව්පියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරු භවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමඟින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය – මහනුවර

**2023.10.20**

එකමත් එක කාලෙක
පුංචි ගෙදරක් තිබුණා. ඒ
ගෙදර හිටියේ අම්මායි,
තාත්තායි, පුතයි. ඒ
දෙමව්පියෝ හරි ම
දුප්පත්. ඒ පවුල දුප්පත්
වුණාට සතුටින් ඉන්නවා.
ඒ පුතාගේ නම සවින්දුල්.
සවින්දුල්ට එක දවසක්
හිතුණා සුරතලෙක්ව
හදන්න. ඊට පස්සේ

සවින්දුල් ඒ ගැන ගිහින් අම්මාටයි, තාත්තාටයි කිව්වා.

"හරි පුතේ අපි ඔයාට හෙට සුරතලෙක්ව ගෙනත් දෙන්නනම්." අම්මායි, තාත්තායි කිව්වා.

"හරි අම්මේ" සවින්දුල් කිව්වා.

“ඒක නෙවෙයි පුතේ
ඔයාට මොන සුරතලෙක්
ද ඕනි” අම්මා ඇහුවා.
“ම්...... අම්මේ මට ඕනි
පුංචි මාළු පැටියෙක්.”
පුතා කිව්වා. ඊට පස්සේ
සවින්දුල් ගියා එයාගේ
හොඳම යාළුවා මිහිත්
එක්ක සෙල්ලම් කරන්න.
එතකොට අම්මායි,
තාත්තායි කතා වුණා.

“අපිට සල්ලිත් නැනේ
ඒක නිසා ළඟ තියෙන
ගඟෙන් ලස්සන
මාළුවෙක් අල්ලගෙන
පුතාට දෙමු.” තාත්තා
කිව්වා. අම්මාත් ඒ
අදහසට කැමති වුණා.
තාත්තා ඊළඟ දවසේ
උදෙන් ම ගියා පුතාට
මාළුවෙක් අල්ලගන්න.
ඊට පස්සේ තාත්තා

මහන්සි වෙලා ලස්සන මාළුවෙක් අල්ලා ගත්තා. අම්මායි, තාත්තායි ඒ මාළු පැටියාව පුතාට ගිහින් දුන්නා. පුතා සතුටින් මාළු පැටියාව ගත්තා. ඊට පස්සේ පුතායි, මාළු පැටියායි හොඳම යාළුවෝ වුණා. පුතා මාළු පැටියාට කෑම දැම්මා,මාළු පැටියාව ඉස්කෝලේ අරන් ගියා.



හවසට මාළු පැටියා එක්ක සෙල්ලම් කළා. ඊට පස්සේ සවින්දුල් පුතයි, අම්මායි, තාත්තායි, මාළු පැටියායි සතුටින් ජීවත් වුණා. පුංචි ඔයාලත් දැක්කා ද සවින්දුල්ගේ අම්මායි, තාත්තායි උත්සාහ කරලා සවින්දුල්ව සතුටු කරපු

හැටි. ඔයාලාටත් පුළුවන් උත්සාහ කරලා දිනන්න.



 **පසුවදන**

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පයෙර්ෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩාම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදන වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශ්වයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදකාවට පිවිසි ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023.10.20